මගේ අංකය - MA/MS/M/12/2013
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

2014.02. 05.

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන්,
ආරෝග්‍ය ශාලා අධ්‍යක්ෂවරුන් සහ වෛද්‍ය අධිකාරිවරුන්,
විමධ්‍යගත ඒකක හා විශේෂිත ව්‍යාපෘති භාර ප්‍රධානීන්.

**කාර්යාලීය සංවිධානාත්මක ව්‍යුහයක් පදනම් කරගත් සෞඛ්‍ය ආයතනවලට අනුයුක්ත කරන ලද විශේෂඥ ශ්‍රේණියේ, පරිපාලන ශ්‍රේණියේ සහ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි පැය ගණන**

පහතින් දක්වා ඇති ආයතනවලට අනුයුක්ත කොට ඇති වෛද්‍ය නිලධාරීන්ගේ අතිරේක රාජකාරි දීමනා සහ 1/20 දීමනාව ගෙවීම සම්බන්ධයෙන් පැණ නැගී ඇති ගැටළු හා බැඳේ. තවද මෙකී කරුණු සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කර ඇති චක්‍රලේඛ වල ප්‍රතිපාදනයන්ද මෙහිදී සලකා බැලීමට ලක් කර ඇත. ගෙවීම් පරිපාටිය තවදුරටත් විධිමත් කිරීම සඳහා අදාල කරුණු වැඩිදුර පැහැදිලි කිරීම සහිතව මින් ඉදිරිපත් කරනු ලැබේ.

(අ). විශේෂඥ ශ්‍රේණියේ, පරිපාලන ශ්‍රේණියේ සහ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන්ගේ වැඩ කරන රාජකාරි පැය ගණන කාර්යාලයීය සංවිධාන ක්‍රමය පදනම් කරගත් රෝගී සත්කාරක ආයතන සහ රෝගී සත්කාරක සේවා නොවන සෞඛ්‍ය ආයතන වශයෙන් වර්ගීකරණය කරන ලද සේවා ස්ථාන පහතින් දක්වා ඇති වගුවෙන් විස්තරාත්මකව දක්වා ඇත.

| ආයතන වර්ගය | සේවයේ නියුතු දිනය | රාජකාරී වේලාවන් |
|---|---|---|
| (1) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, විශේෂිත ව්‍යාපෘති | සඳුදා සිට සිකුරාදා | පෙ.ව 8.00 - ප.ව 12.00<br>ප.ව 2.00 - ප.ව 4.00 |
| | සෙනසුරාදා | පෙ.ව 8.00 - ප.ව 12.00 |
| (2) සෞඛ්‍ය අමාත්‍යාංශය (ප්‍රධාන කාර්යාලය) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, විශේෂිත ව්‍යාපෘති, අනෙකුත් විමධ්‍යගත ඒකක සහ අනෙකුත් සියළුම කාර්යාල | සඳුදා සිට සිකුරාදා දක්වා | පෙ.ව 8.30 - ප.ව 12.00<br>ප.ව 1:00 - ප.ව 4.15 |

| | | |
|---|---|---|
| ක්‍රමයක් සහිත සෞඛ්‍ය සත්කාරක නොවන සෞඛ්‍ය ආයතන | | |

(අ) ඉහත වගුවේ විශේෂ තීරුවට දක්වා ඇති ආකාරයට රාජකාරි පැය ගණනට අමතරව ඊට බාහිරව සිදුකරනු ලබන රාජකාරීන් සඳහා අතිරේක රාජකාරී දීමනා ගෙවීම සිදුකල යුතුය.

(ආ) සති අන්තවල නීරත යන රාජකාරි කටයුතු සඳහා විශේෂඥ ශ්‍රේණි, පරිපාලන ශ්‍රේණි සහ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් සඳහා 1/20 දීමනාව ගෙවීම සිදුකල යුතුය. (1. වර්ගීකරණයට අයත් ආයතන සඳහා ඉරිදා දිනවලට 2. වන වර්ගීකරණයට අයත් ආයතන සඳහා සෙනසුරාදා හා ඉරිදා දින සඳහා ඉහත දක්වා ඇති වගුවේ ආකාරයට) තවද රජයේ නිවාඩු දිනවල සිදුකරන රාජකාරීන් සඳහා මෙකී වර්ගීකරණ දෙකටම අයත් ආයතන සඳහාද එකසේ ගෙවීම සිදුකල යුතුය. අදාල රාජකාරියෙන් පැය 6ක් සපුරා ඇති විටකදී මෙකී ගෙවීම සිදුකළ යුතුය.

(ඇ) මෙය 2013.02.01. දින සිට ක්‍රියාත්මක වන බවට වගබලා ගත යුතුවෙයි.

සෞඛ්‍ය අමාත්‍යාංශ CA/[illegible] සහ 2010.12.23 දිනැතිව හා 2013.06.26 දිනැතිව මාගේ අත්සනින් යුක්තව නිකුත් කර ඇති චක්‍රලේඛනයන් අවලංගු කරනු ලැබේ.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

පිටපත් -

1. සියළුම අතිරේක ලේකම්වරුන් (වෛද්‍ය සේවා, මහජන සෞඛ්‍ය හා පරිපාලන)
2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
3. සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
4. ප්‍රධාන ගණකාධිකාරී